# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2013
# வருடாந்த செயல்திறன் அறிக்கை - 2013
# Annual Performance Report - 2013

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

පරපුරක අභිමානය

## දර්ශනය

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීම.

## මෙහෙවර

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරීන්ගේ සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුළින් ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්ත්වය නඟා සිටුවීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සක්‍රීය දායකත්වය නිබඳව ලබා දීම.

# පරපුරක අභිමානය

# පටුන


| අනු අංකය අංකය | ප්‍රස්තුතය | පිටු |
|---|---|---|
| 01 | දෙපාර්තමේන්තුව පිළිබඳ විවරණය | 04 |
| 02 | දෙපාර්තමේන්තු ප්‍රධානීන් | 05 |
| 03 | දෙපාර්තමේන්තුව පිළිබඳ සැකෙවින් | 06 |
| 04 | මහජන සම්බන්ධතා අංශය | 08 |
| 05 | ලියාපදිංචි අංශය | 9-10 |
| 06 | තොරතුරු තාක්ෂණ අංශය | 11 |
| 07 | සන්නද්ධ සේවා අංශය | 11-12 |
| 08 | පාලන හා මානව සම්පත් කළමණාකරන අංශය | 13 |
| 09 | විදේශ විශ්‍රාම වැටුප් අංශය | 13-15 |
| 10 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය | 15-18 |
| 11 | ප්‍රතිපත්ති අංශය | 18-19 |
| 12 | නීති අංශය | 19 |
| 13 | අභ්‍යන්තර විගණන අංශය | 20-21 |
| 14 | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල | 21-24 |
| 15 | ගිණුම් අංශය | 25-28 |
| 16 | මාධ්‍යය ඒකකය | 29 |
| 17 | ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රණාම | 30-31 |

# දෙපාර්තමේන්තුව පිලිබඳ විවරණය........

මහා භාණ්ඩාගාරයේ අතිරේක ආයතන පාලකවරයෙකු යටතේ පාලනය වූ විශ්‍රාම වැටුප් අංශයත්, මුදල් අමාත්‍යාංශය යටතේ උප දෙපාර්තමේන්තුවක්ව පැවති වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයත් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලත් යන සමාන්තර විෂයයන් ඒකීය ආයතනයක ස්ථානගත කරමින් 1970/12/23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපනය වන්නේය. ඒ අනුව උක්ත අමාත්‍යාංශය යටතේ 1970/05/05 දින විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය වන අතර එතැන් පටන් වර්තමානය දක්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන චක්‍රලේඛ ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය යාවත්කාලීන වන්නේය.

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් මතු නොව රාජ්‍ය සේවයේ යෙදී සිටීමේදී පටන් රාජ්‍ය සේවකයාගේත්, ඔවුන්ගේ කලත්‍රයන්ගේත් රාජ්‍ය මට්ටමේ එකම සමාජ ආරක්ෂණ ක්‍රමය ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය නව සංකල්ප සමඟ ඉදිරියට යන සමාජයේ සියලු අංගෝපාංගයන් සමඟ සම්බන්ධ වෙමින් රාජ්‍ය සේවකයාගේ සාධනීය අපේක්ෂාවන්ට ගැළපෙන ආකාරයෙන් නිරන්තරව යාවත්කාලීන විය යුතුව ඇත.

හුදෙක් විශ්‍රාම වැටුප් ගෙවීමකින් ඔබ්බට ගොස් ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ද අභියෝගයට ලක් නොකර සාම්ප්‍රදායික රාජ්‍ය සේවය උසස් තලයකට ඔසවා තැබීමේ මහඟු කාර්ය භාරයක් දෙපාර්තමේන්තුව සතු වන්නේය. සේවාලාභියා වෙතට ගොස් දුක් සැප විමසන, ඔවුන් වෙත සංවේදී හා මානුෂීය දෘෂ්ටියක් හෙළීමෙන් නොනැවතී ඔවුන්ව ආර්ථික අතින් ශක්තිමත් භාවයක් කරා රැගෙන යාම දෙපාර්තමේන්තුව සතු වගකීම වන්නේය. ඒ අනුව නූතනත්වයට ගැළපෙන තාර්කික වූ නව ගෙවීම් ක්‍රම මෙන්ම වෙනස් වන අපේක්ෂාවන්ට ගැළපෙන විකල්ප ඉදිරිපත් කිරීමත් ඉන් ඔබ්බට ගොස් ඒ ඒ පුද්ගල භාවයන්ට වෙන් වූ හැකියාවන් හඳුනාගෙන එක් එක් පුද්ගලයා වෙන් වෙන්ව සැලකිල්ලට ගැනෙන නව සමාජ ආරක්ෂණ හා ආර්ථික වැඩ පිළිවෙලක් වෙත ගමන් කිරීම අප ඉදිරියේ පවතින අභියෝගයකි.

# දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2013.12.31 දිනට)

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් - එස්.එස්. හෙට්ටිආරච්චි

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ -කේ.ඒ.සුභද්‍රා වල්පොළ

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ- ඒ.බී.එම්. අෂ්රෆ්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ- කේ.ඒ.එස්. මහේෂිකා

**මහජන සම්බන්ධතා අංශය**

එම්.ජී.සී.එස්. රණසිංහ - සහකාර අධ්‍යක්ෂ

**ලියාපදිංචි ශාඛාව**

එච්.ජී.ටී.එස්. ප්‍රියදර්ශනී - සහකාර අධ්‍යක්ෂ

**තොරතුරු තාක්ෂණ ශාඛාව**

එම්.ජී.සී.එස්. රණසිංහ - සහකාර අධ්‍යක්ෂ

**සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය**

ජී.සී. දෙනගම - සහකාර අධ්‍යක්ෂ

**වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය**

එච්.ඒ.පී.කේ.අයිරංගනී - සහකාර අධ්‍යක්ෂ

කේ.එම්.ජී.ඒ. කරුණාරත්න - සහකාර අධ්‍යක්ෂ

වයි. යූ. පී. දයාරත්න - ගණකාධිකාරී

**ප්‍රතිපත්ති හා සැලසුම් අංශය**

එල්.ඒ.ඒ.ඒ. ශශී විරාජිනී - සහකාර අධ්‍යක්ෂ

**විදේශ විශ්‍රාම වැටුප් අංශය**

ආර්.එම්.කේ.ජී.සංජීවනී - සහකාර අධ්‍යක්ෂ

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය**

එස්.එන්.හපුආරච්චි - ලේකම් හා ගණකාධිකාරී

එස්.එම්.ටී.ඩී. සමරතුංග - ගණකාධිකාරී

**ගිණුම් අංශය**

කේ.වී. දිසානායක - ප්‍රධාන ගණකාධිකාරී

පී.එස්.හෙට්ටිගේ - නි. ප්‍රධාන ගණකාධිකාරී

ඩී.එම්.එම්.දිසානායක - ගණකාධිකාරී

ටී.ඩී.ගම්මඩුවත්තගේ - ගණකාධිකාරී

# දෙපාර්තමේන්තුව පිළිබඳ සැකෙවින්

දකුණු ආසියාතික කලාපීය රට වලට සාපේක්ෂව වැඩි ආයු අපේක්ෂාවක් සහිත ජනතාවක් වාසය කරන, එමෙන්ම අනෙක් රට වලට සාපේක්ෂව වයස අවුරුදු 60 කට ඉහල වැඩි ජනගහනයක් ජීවත් වන රටක් ලෙසත් ශ්‍රම බලකායෙන් සැලකිය යුතු ඉහල ප්‍රතිශතයක් විශ්‍රාම වැටුප් ආවරණය ලබන පිරිසක් වාසය කරන රටක් ලෙසත් ශ්‍රී ලංකාව අනෙක් කලාපීය රටවලට සාපේක්ෂව සමාජ ආරක්ෂණය අතින් ඉහල මට්ටමක සිටින බව ආසියානු සංවර්ධන බැංකු වාර්තා දත්ත විශ්ලේෂණය කිරීමෙන් පසක් කර ගත හැකිය.


දැනට මෙරට ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල වන ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වෙන් කර විස්තර කල හැකිය. එනම් එක් වරක් පමණක් හිමිවන ප්‍රතිලාභ සහ මාසිකව හිමිවන ප්‍රතිලාභ වශයෙනි. එහිදී එක් වරක් පමණක් හිමිවන ප්‍රතිලාභ අතර විශ්‍රාමිකයාගේ අඩු නොකල මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක් නිලධාරියාගේ මනාපය පරිදි ලබා දෙන විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ප්‍රධාන තැනක් ගන්නේය. තවද රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම ගැනීමට ප්‍රථම මියයාමකදී ඔහු හෝ ඇය මිය යන දිනය විශ්‍රාම ලබන දිනය සේ සලකා ගණනය කරනු ලබන අඩු නොකල මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක් හෝ ඔහුගේ මාසික වැටුප මෙන් 12 ගුණයක් යන දෙකෙන් වැඩි අගයක් ගන්නා මුදල අදාල පුද්ගලයාගේ යැපෙන්නන් වෙත ලබා දීමේ මරණ පාරිතෝෂිකයද ප්‍රධාන ස්ථානයක් උසුලන්නේය. මීට අමතරව මාස 120 ට අඩු සේවා කාලයක් සහිත රාජ්‍ය සේවකයන් වෙත ගෙවනු ලබන සේවා පාරිතෝෂිතය, කරුණා සහගත දීමනාව හා මාස 120ට නොඅඩු සේවාවක් සහිත නමුත් විශ්‍රාම වැටුප් රහිතව සේවය නිමා කරන රාජ්‍ය සේවකයන් වෙත ගෙවනු ලබන දෛනික සේවා පාරිතෝෂිතයද මීට අමතරව විශේෂ වන්දි, කරුණා සහගත දීමනා , පොලිස් වන්දි ආදිය එක් වරක් පමණක් ලබන ප්‍රතිලාභ අතර වේ. මීට අමතරව මාසිකව ලබන ප්‍රතිලාභ අතර මාසික විශ්‍රාම වැටුප, වන්දි විශ්‍රාම වැටුප, තුවාල දීමනා, පුණ්‍යාධාර දීමනා, යහපත් සේවා දීමනා, වැන්දඹු විශ්‍රාම වැටුප හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප, අනත්දරු විශ්‍රාම වැටුප, ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප, හමුදා දුබලතා විශ්‍රාම වැටුප, යැපෙන්නන්ගේ දීමනාව යන ප්‍රතිලාභ සිවිල් විශ්‍රාම වැටුප් ලාභීන්ට, හමුදා විශ්‍රාම වැටුප් ලාභීන්ට හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලාභීන් යන අංශ තුනම නියෝජනය කරන ප්‍රතිලාභීන්ට හිමි වන්නේය. එහිදී සිවිල් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 1934.02.05 දිනැති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ මූලික නෛතික ලියවිල්ල ලෙස ගන්නා නමුත් දැනට ක්‍රියාත්මක වන්නේ 1972 මැයි 05 වන දින නිකුත් වූ එහි සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයයි. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත වැන්දඹු අනත්දරු හා අබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා නෛතික ලියවිල්ල වන්නේ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් හඳුන්වා දෙනු ලැබූ 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතයි. මීට අමතරව සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප 1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය 1981.09.01 සිට මේ දක්වා ක්‍රියාත්මක වන අතර 1970.12.23 දින සිට දෙපාර්තමේන්තුව යටතේ කළමනාකරණය වන 1942 අංක 18 දරණ ආඥා පණත මගින් විශ්‍රාම වැටුප් අහිමි රජයේ ඇතැම් සේවක සේවිකාවන් වෙත මූල්‍යමය ප්‍රතිලාභ ලබා දෙන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලද මීට අමතර වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන්නේය.

මෙවන් විධිමත් මෙන්ම ඉහල සමාජ රක්ෂණ වත්කමක පෞඩ ඉතිහාසයක් ඇති විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 2013 වසරේදී සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය වෙනුවෙන් රුපියල් මිලියන 139,445.00 ක මුදලක් වැය කර ඇත.

# මහජන සම්බන්ධතා අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිරන්තරයෙන් යාවත්කාලීන වන තොරතුරු සම්බන්ධයෙන් විමසීම් කිරීමටත් විශ්‍රාමික ප්‍රජාව හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම හා ඔවුන් සමග මනා සම්බධතාවයක් පවත්වා ගැනීම සදහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා අංශය පිහිටුවා ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන සියලු සේවාදායකයින් වෙත අදාල සේවාව ලබා දීම සදහා ඔවුන් නියමිත අංශ වෙත යොමු කිරීම හා කෙටි දුරකථන අංක 1970 හරහා දෙපාර්තමේන්තුව අමතන සේවා දායකයින් වෙත කඩිනම් තොරතුරු සැපයීමේ සේවාව පවත්වාගෙන යාම මෙම අංශය මගින් සිදු කරයි.

එමෙන්ම කාර්යාල වෙලාවෙන් බැහැරව ලැබෙන ඇමතුම් අධීක්ෂණය හා විශ්‍රාමික සංගම් සමග සම්බන්ධතාවය පවත්වාගැනීමද මෙහි කාර්යභාරයන් අතර වේ. වසර 2013 දී මහජන සම්බන්ධතා අංශය සමග සේවාලාභීන් සම්බන්ධවූ ආකාරය පහත දැක්වේ.



# ලියාපදිංචි අංශය

විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියේදී පළමුව හමුවන අංශය වනුයේ මෙම අංශයයි. සමස්ත ක්‍රියාවලියේ ආරම්භය සනිටුහන් කරමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලීයේ පිවිසුම් දොරටුව ලෙස ලියාපදිංචි අංශය ක්‍රියා කරයි. මෙමඟින් විශ්‍රාමික මහත්ම මහත්මීන් වෙත ඔවුන්ගේ ඉදිරි විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන විශ්‍රාම වැටුප් අංකයක් ලබා දීම සිදුවේ. එමඟින් විශ්‍රාමිකයා හට ඉදිරි විශ්‍රාමික දිවිය තුරාම මෙම අංකය හා සම්බන්ධව ඔහුට හෝ ඇයට අවශ්‍ය විස්තර ලබා ගත හැකි වේ.


මෙම ශාඛාව මඟින් ,

- සියලු විශ්‍රාමිකයන් ලියාපදිංචි කිරීම
- සේවා පාරිතෝෂික හා මරණ පාරිතෝෂික
- සංශෝධන හා දීමනා ගෙවීම


යන කරුණු සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීම සිදු වේ.

ලියාපදිංචි ශාඛාවේ සිදු වන ක්‍රියාවලිය මඟින් 2013 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

## 2013 වර්ෂය තුල ලියාපදිංචි වු විශ්‍රාමික සංඛ්‍යාව




## 2013 වර්ෂය තුල ලියාපදිංචි කල සංශෝධන අයදුම්පත් සංඛ්‍යාව



## තොරතුරු තාක්ෂණ අංශය


1100 ට අධික සේවක සංඛ්‍යාවක් හා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, බැංකු, තැපැල් කාර්යාල, සියළුම රාජ්‍ය ආයතන, විශ්‍රාමිකයන් මෙන්ම සියළුම රජයේ සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සෘජුවම හෝ වක්‍රව සම්බන්ධ වන විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය, වඩා කාර්යක්ෂම කිරීම සඳහා එහි ක්‍රියාකාරීත්වය, කළමනාකරණය හා පරිපාලනය තොරතුරු තාක්ෂණ පද්ධති මත පදනම්ව වැඩි දියුණු කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කිරීම 2013 වර්ෂයේ තොරතුරු තාක්ෂණ අංශය ලද ඉලක්කයයි. ඒ අනුව එක් පැත්තකින් විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පරිගණකගත කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයන් හා අනෙක් පසින් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ ක්‍රියාවලිය පරිගණකගත කිරීම හා ඒ ආශ්‍රිත තාක්ෂණික, මානව හා භෞතික සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමුවිය.


## සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය

1949.10.10 දින සිට ක්‍රියාත්මක වූ විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ යුද හමුදා නිත්‍ය බල සේනාවට අයත් නිලධාරි, සෙසු නිලයින් සඳහා විශ්‍රාම වැටුප් හිමි වුවද, යුද හමුදා ස්වෙච්ඡා බලසේනාවේ නිලධාරි/සෙසු නිලයන්ට සහ කාන්තා නිලධාරිනියන් හට හා සෙබලියන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබාදෙන ලද්දේ දැනට බල පැවැත්වෙන 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය යටතේය. මෙය 1981.09.01 දින සිට ක්‍රියාත්මක වේ.

සන්නද්ධ හමුදා අංශයෙහි ප්‍රධාන කාර්ය භාරය වන්නේ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ හා සෙසු නිලයන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ සියලුම කටයුතු කළමනාකරණ මඟින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සකස් කර ගෙවීම් කිරීමට සහය වීමයි. සන්නද්ධ සේවා විශ්‍රාමිකයන් සඳහා පහත සඳහන් විශ්‍රාමික ප්‍රතිලාභ රාශියක් රජය විසින් ලබා දීමට කටයුතු කර ඇත. මෙම විශ්‍රාම වැටුප් නිසි පරිදි ගණනය කර සැකසීම හා සංශෝධන ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ.

# 2013 වර්ෂයේ හිමිකම් ප්‍රදානය කිරීම



# පාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය


දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් ..කළමනාකරණය හා භෞතික සම්පත් නඩත්තුව මෙම අංශය මඟින් ඉටුකරනු ලබයි.

පුහුණු අංශය මඟින් දෙපාර්තමේන්තුවේ මානව සම්පත ගුණාත්මකතාව ඉහල දැමීම සඳහා පුහුණු වැඩමුළු සංවිධානය හා ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම, සේවාදායකයන්ට ණය ලබා ගැනීම් සඳහා පහසුකම් සැලසීම ආදී ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.


# විදේශ විශ්‍රාම වැටුප් අංශය

**සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම - 2013 ජනවාරි සිට දෙසැම්බර්**


විශ්‍රාමිකයින්ගේ ව්‍යාප්තිය




## විදේශගත වී සිටින විශ්‍රාමිකයින් හට කරන ගෙවීම්




## රටවල් අතර විශ්‍රාමික ව්‍යාප්තිය



## රටවල් අතර ගෙවීම් ව්‍යාප්තිය




## වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අංශය

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබූ රජයේ සේවකයෙකුගේ / සේවිකාවකගේ, වැන්දඹුව, වැන්දඹු පුරුෂයා, අනත්දරුවන්ට හා ආබාධිත දරුවන්ට ආර්ථික වශයෙන් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා වැන්දඹු අනත්දරු පනත් මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන තුල ප්‍රතිලාභ සලසාදීම මෙම අංශයේ කාර්ය භාරයයි.

ඉංග්‍රීසි ජාතිකයින් මෙරට පාලනය කරන සමයේ රාජ්‍ය සේවය උදෙසා පිරිනමන ලද සුවිශේෂී වරප්‍රසාදයකි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය. අවුරුදු සියයකට වඩා පැරණි මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය රජය නියෝජනය කරමින් මහජනතාව සමඟ සම්බන්ධීකරණය කටයුතු කරන රාජ්‍ය සේවකයාට ප්‍රතිලාභ ලබා දීම මෙන්ම ඔහුගේ පවුලේ අය සුරක්ෂිත කිරීමේ පරමාර්ථයෙන් 1898 දී ඔවුන් හදුන්වා දෙන ලදි. 1898 දී රාජ්‍ය නිලධාරීන්ට පමණක් මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීම ආරම්භ වුවද, මෙරට අධ්‍යාපනයේ ව්‍යාප්තිය තුලින් රාජ්‍ය සේවයට වැඩි වශයෙන් නිලධාරිනියන් එකතු වීම හේතු කොට ගෙන 1983 දී වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයද ආරම්භ කරන්නේය.


රැකවරණයෙන් පිරි සමාජයක් ගොඩ නගන මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රට දැය වෙනුවෙන් කැපකළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සුරක්ෂිත කිරීම ප්‍රධාන අරමුණක් වන්නේය. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඇතුළු සමස්ත පවුල් ඒකකයම සුරක්ෂිත කිරීම ඉලක්ක කරගනිමින් පරපුරක අභිමානය ඇති කිරීමෙහිලා දැවැන්ත සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියක් ලෙස වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය වර්තමානයේ ක්‍රියාත්මක වන බව සඳහන් කල යුතුය.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් අද වනවිට ප්‍රතිලාභ ලබන පිරිස මෙතෙකැයි කියා කිව නොහැකි තරම්ය. මේ සඳහා වැටුපෙන් සුළු ප්‍රතිශතයක් අයකර ගත්තද ඉන් ලැබෙන ප්‍රතිලාභය ඉතා විශාලය. එය එක් පැත්තකින් බැලුවහොත් අවිවාහකව සේවය අවසන් කරන සේවකයාට ලැබෙන තැන්පතු මුදලක් වන්නේය. විවාහක නම් තමාගේ කලත්‍රයා , දරුවන් සඳහා තමා නොදැනුවත්වම ආරක්ෂණ ක්‍රමයක් සැලසුවා සේය. ළදරු විය , ළමාවිය පසු කරමින් තරුණ වියට එළඹීමෙන් පසු අපේ ජීවිතය විවාහය නැමති ආභරණයෙන් සරසා ගැනීම මත වැන්දඹු අනත්දරු ක්‍රමයේ ප්‍රතිලාභ අර්ථ පූර්ණ වන්නේය. මෙහිදී ප්‍රමුඛස්ථානය ලැබෙනුයේ නීත්‍යානුකූල පළමු විවාහක බිරිඳට/ස්වාමියාට පමණක් වීම විශේෂත්වයකි. දෙවනි විවාහයක් සිදුවූ විටකදී පළමු විවාහය මියයෑම හෝ නිත්‍යාණුකූල අවසන් වීමක් සිදුවී තිබිය යුතුය. මීට පෙර මෙවැනි අවස්ථාවක ගෙවමින් තිබූ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප නතර කලද 2010.12.16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 ට අනුව දෙවන වර විවාහයක් සඳහා වැටුපෙන් 50% ලබා දීම සිදු කරයි.

මෙම වැටුප් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබෙන පාර්ශවය අනුව එකී වැටුප හැඳින්වීමද විශේෂත්වයකි. රාජ්‍ය නිලධාරියා මිය ගොස් ඔහුගේ බිරිදට වැටුප හිමි වීම "වැන්දඹු විශ්‍රාම වැටුප " ලෙසත්, රාජ්‍ය නිලධාරිණිය මියගොස් ඇයගේ ස්වාමියාට වැටුප හිමි වීම "වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප " ලෙසත් රාජ්‍ය සේවයේ නියුතු දෙමව්පියන්

මියගිය පසු ඔවුන්ගේ, රැකියා විරහිත, විවාහ පදනමින් තොරව, අවුරුදු 26 ට අඩු දරුවන් සඳහා ගෙවන වැටුප "අනත්දරු විශ්‍රාම වැටුප " ලෙසත් උපතේදී හෝ අවුරුදු 26ට පෙර ශාරීරික හෝ මානසික වශයෙන් අබාධිත වූ සිය ජීවනෝපාය සලසා ගැනීමට එකී ආබාධිත තත්වය බාධකයක් වූ දරුවන් සඳහා ගෙවන වැටුප "අබාධිත අනත්දරු විශ්‍රාම වැටුප " ලෙසත් හඳුන්වයි. මේ වන විට අබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම දෙදහසකට වැඩි ප්‍රමාණයක් තිබෙන බව අතිශෝක්තියෙන් තොරව සඳහන් කල හැකිය. මෙම ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ ලැබෙනුයේ රාජ්‍ය සේවකයාගේ මාසික වැටුපෙන් තනතුරේ ස්වභාවය මත 6% හෝ 7% දායක මුදල් වශයෙන් අයකර ගැනීමක් සිදු කරන නිසාය. ප්‍රතිලාභ ලබා දීමට රාජ්‍ය සේවකයාගේ සේවා කාලයේ ගණන් ගැනීමක් සිදු නොකරයි. මෙම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපේ තවත් විශේෂත්වයක් වන්නේ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාමයෙන් පසු දායක මුදල් අය කර නොගැනීමයි. ඒ නිසා විශ්‍රාමයෙන් පසු සිදු කරන විවාහයන් සඳහා මෙකී ක්‍රමයේ ප්‍රතිලාභ නොලැබෙන්නේය.

පරපුරක අභිමානය සුරකින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ සිදුකරන මෙම ආරක්ෂණ ක්‍රියාදාමය ලක්ෂ 14 ක් වූ රාජ්‍ය සේවකයාගේ "පවුල " නැමති ඒකකය සුරක්ෂිත කරන දැවැන්ත ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකාව තුළ රැකවරණයෙන් පිරි සමාජයක් ගොඩ නැගීමේදී මෙම ක්‍රමය ලොව අනෙක් රටවල් අභිභවා රාජ්‍ය සේවය ඉදිරියට ඒමක් වන්නේය.




**මුදල් රැස් කිරීම හා කළමනාකරණය**

රජයේ සේවක සේවිකාවන්ගේ වැටුපෙන් 6 % හා 7 % බැගින් අයකරනු ලබන වැන්දඹු අනත්දරු

විශ්‍රාම වැටුප් දායක මුදල් පහත පරිදි රැස්කර දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම පවත්වාගෙන යාම .

| | රු.මිලියන |
|---|---|
| මධ්‍යම රජයේ ආදායම | 8,874,091,355 |
| පළාත් සභා ආදායම | 6,281,194,190 |
| රැස් කරන ලද මුළු ආදායම | 15,155,285,545 |



**ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවකුට ඔහුගේ ජීවනෝපාය සලසාගැනීමට නොහැකිවන්නාවූ ශාරීරික හෝ මානසික ආශක්‍යතාවයකින් පෙළෙන බවට තීරණය කළවිට ඒ අනත්දරුවාට වයස නොතකා යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට ප්‍රතිපාදන සලසාඇත.

| කාර්යය | වසර තුළ නිමකළ ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|
| වැන්දඹු/වැන්දඹු පුරුෂ ලිපිගොනු යාවත්කාලීන කිරීම | 31,812 |
| සිවිල් හා පළාත් පාලන වැන්දඹු ,වැන්දඹු පුරුෂ වැන්දඹු අනත්දරු ගැටළු විසඳීම | 1,222 |
| වැන්දඹු/වැන්දඹු පුරුෂ ලිපිගොනු ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම | 8,654 |
| ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන නිකුත් කිරීම | 268 |

## ප්‍රතිපත්ති අංශය

රජයේ විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සම්පාදිතව පවත්තා ප්‍රතිපත්තිමය කරුණු අර්ථ දැක්වීම, අවස්ථානුකූලව එලෙස පවතින ප්‍රතිපත්තිමය කරුණු සංශෝධනය කිරීම හා නව ප්‍රතිපත්ති තීරණ වලට එළඹීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. තවද රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සාපේක්ෂ වශයෙන් සාධාරණ මට්ටමකට පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සැකසීම ද ප්‍රධාන වගකීමකි.

**ඉටු කෙරෙන කාර්යයන්**

- ව්‍යවස්ථාපිත සංශෝධන සඳහා අදාල වන්නාවූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා ගැසට් නිවේදන නිකුත් කිරීම.
- විශ්‍රාමික ප්‍රජාව පෞද්ගලිකව ද සියළුම රාජ්‍ය ආයතන මට්ටමින් ද යොමු කරනු ලබන ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම්/ උපදෙස් සැපයීම.
- සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම් ජාලය පවත්වාගෙන යාමේදී අදාල වන්නාවූ සියලු අණපනත්, චක්‍රලේඛ, ගැසට් නිවේදන යනාදී ලිපි ලේඛණ ඇතුළත් තොරතුරු පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- නීති කටයුතු සඳහා පෙනී සිටීම.

විශ්‍රාමික ප්‍රජාව සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනිම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 2013 වර්ෂයේ නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

| | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|
| 01 | 01/2013 | සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන් සඳහා හිඟ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම |
| 02 | 02/2013 | විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලයට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම |
| 03 | 03/2013 | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2010/13යටතේ වැන්දඹු වැටුපෙන් %50ක් ගෙවීම සම්බන්ධව වැටුප ගණනය කිරීම |
| 04 | 10/2011(03) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2011/10ප්‍රකාරව සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර ඉදිරිපත් කිරීම |
| 05 | 04/2013 | විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම (පෑන් ඒෂියා) |
| 06 | 05/2013 | 2014වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීමේ දින තීරණය කිරීම |
| 07 | 06/2013 | නොගෙවූ විශ්‍රාම පාරිතෝෂික මුදල්/මාසික විශ්‍රාම වැටුප මුදල් ගෙන්වා ගැනීම |

## නීති අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පැන නගින නීතිමය ගැටළුවලට අදාලව කටයුතු කිරීම මෙම අංශයේ කාර්ය භාරයයි.

## අභ්‍යන්තර විගණන අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඉහළ කළමනාකරණයට සහාය ලබා දීම සඳහා වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ඵලදායි සහ කාර්යක්ෂම ලෙසත් අණපනත්,නීති රීති, රෙගුලාසි වලට අනුකූලව සිදු කරන්නේද යන්න, පරික්ෂා කිරීම සඳහා විශ්‍රාම වැටුප් හා සම්බන්ධ රාජ්‍ය ආයතන ජාලය විගණනය කිරීම අභ්‍යන්තර විගණන අංශයේ අරමුණු වේ.

## ප්‍රධාන කාර්යභාර්ය

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් සම්බන්ධ ආයතන විගණන පරීක්ෂාවට ලක් කර විගණන විමසුම් නිකුත් කිරීම.
- මහජන පෙත්සම් සම්බන්ධ කටයුතු කිරීම.
- විශේෂ පරීක්ෂණ
- විශ්‍රාමික අභියාචනා / ඉල්ලීම සම්බන්ධ කටයුතු කිරීම.
- ගැටළු සහිත ලිපිගොනු සදහා අවශ්‍ය උපදෙස් / නිරීක්ෂණ ලබාදීම.
- රජයේ විගණන අංශය /රාජ්‍ය පරිපාලන අභ්‍යන්තර විගණන අංශය මගින් ලැබෙන විගණන විමසුම් සදහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අංශ සම්බන්ධකර පිළිතුරු සැපයීම.

- විශ්‍රාම වැටුප් විගණන කාර්ය සඳහා යොදවන සීමිත මානව සම්පත් උපයෙ තුළින් ප්‍රාදේශීය ලේකම් කාර්යලයන්හි විශ්‍රාම වැටුප් විගණනයට වැඩි අව යොමු කරනු ලැබීය.

| විගණන පරීක්ෂණ ක්‍රියාවලිය | සංඛ්‍යාව |
|---|---|
| විගණනයට ලක්කල ප්‍රා.ලේ.කා. | 96 |
| වෙනත් කාර්යාල | 04 |
| විශේෂ පරීක්ෂණ | 14 |
| පිළිතුරු යවන ලද විගණන විමසුම් | 28 |
| කටයුතු කරන ලද මහජන පැමිණිලි | 294 |
| පරීක්ෂා කරන ලද ලිපිගොනු | 101 |

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පනත යටතේ 1942.04.01 දින මාසික වැටුප් ලබන ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයන් සඳහා සේවා අවසාන මුල්‍ය ප්‍රතිලාභ සහිතව ආරම්භ කරන ලද අතර 2003 අංක 17 දරන සංශෝධන පනත මඟින් අරමුදලේ අරමුණු හා පරමාර්ථ තවදුරටත් පුළුල් කරන ලදි. අරමුදලේ පාලනය පංච පුද්ගල මණ්ඩලයක් මඟින් සිදු කරනු ලැබේ.

වර්ෂ 1942 අංක 18 දරණ ආඥා පනතින් සංස්ථාපනය කරන ලදුව පුරා දශක 7ක අධික කාලයක් සක්‍රීයව පවතින අරමුදලකි රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල. ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයන්ගේ සේවා අවසාන ප්‍රතිලාභ තහවුරු කරනු වස් ආරම්භ කරන ලද මෙම අරමුදල වර්තමානය වන විට සාමාජිකයන් 226857 දෙනෙකු සඳහා ආවරණය සලසනු ලබයි. සේවක දායකත්වයක් සහිත සේවා අවසාන ප්‍රතිලාභ ක්‍රමයක් වන මෙය ලංකාවේ පුරෝගාමීම අරමුදල් කිහිපයෙන් එකකි.

වාර්ෂිකව සිටි සාමාජිකයන් 6000 කට අධික ප්‍රමාණයකට සේවා අවසාන ප්‍රතිලාභ ලබා දෙනු ලබන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ප්‍රධාන ආකාරයෙන් හතරක් යටතේ ප්‍රතිලාභ ලබා දෙනු ලබයි.

<u>14 වන වගන්තිය යටතේ ප්‍රතිලාභ ලබා දීම.</u>

මෙම වගන්තිය යටතේ ස්ථිර රාජ්‍ය සේවයට එක් වීමකින් තොරව නිසි පරිදි සේවය අවසන් කරනු ලබන දායකයින් හට සිය වැටුපෙන් අය කරන ලද 8% අනිවාර්යය දායකය හා රජය විසින් ලබා දෙන 12% රාජ්‍ය දායකය යන මුළු මුදල් ප්‍රමාණය හා ඊට අදාල පොලී මුදලත් ගෙවනු ලබයි.

<u>20 වගන්තිය යටතේ ප්‍රතිලාභ ලබා දීම</u>


මෙහිදී විශ්‍රාම වැටුප් රහිත තත්වයේ සිට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තත්වයට පත්වනු ලබන දායකයන් හා සිය වැටුපෙන් 8% ප්‍රමාණයකින් අය කරන ලද අනිවාර්යය දායත මුදල හා ඊට අදාල පොළිය ගෙවන් ලබයි. එමෙන්ම මෙම සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී අදාල කර ගනු ලබයි.


<u>16 වගන්තිය යටතේ ප්‍රතිලාභ ලබා දීම.</u>


විනය හේතු මත සේවය අවසන් කරනු ලබන දායකයන් හට සිය වැටුපෙන් අය කරන ලද 8% ක දායක මුදල හා ඊට අදාල පොලිය ගෙවනු ලබයි.

<u>සදොස් ගෙවීම්</u>

අරමුදලට දායක විය නොහැකි පුද්ගලයෙකු විසින් යම් හෙයකින් දායක මුදල් බැර කර ඇති විට කිසිඳු පොලී ගෙවීමකින් තොරව එම මුදල් ප්‍රමාණය පමණක් නැවත ලබා දීම සිදු කරනු ලබයි.


සාමාජික සංඛ්‍යාවේ වර්ධනය
240000
230000
220000
210000
200000
190000
180000
සංඛ්‍යාව
2005
2006
2007
2008
2009
2010
2011
2012
2013
වර්ෂය
සාමාජික සංඛ්‍යාව


දායක මුදල් ලැබීම් සහ ගෙවීම් (රු මිලියන)
2000
1800
1600
1400
1200
1000
800
600
400
200
0
රු. මිලියන
2005
2006
2007
2008
2009
2010
2011
2012
2013
වර්ෂය
ගෙවීම්
ලැබීම්




## ගිණුම් අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය සම්පත් වඩා කාර්යක්ෂම හා ඵලදායී අයුරින් පවත්වා ගෙන යාම සඳහා විධිමත් වූ ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා දායකත්වය සැපයීම මෙම අංශය මගින් සිදු කරයි .

- **ගිණුම් ඒකකයේ කාර්යයන් :-**


- වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයකට අවශ්‍ය සැලසුම් පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් ඇතුළු සියළුම ගෙවීම් සඳහා අවශ්‍ය අත් මුදල් ලබා ගැනීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන හා අත්මුදල් ලබා දීමේ සම්බන්ධීකරණ කටයුතු හා පසු විපරම් කටයුතු.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු.
- රාජ්‍ය ගිණුම්කරණයට අදාළ වන්නා වූ දෙපාර්තමේන්තු දත්තයන් මාසිකව භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම සහ වාර්ෂික විසර්ජන ගිණුම ඇතුළු සියළුම ගිණුම් ඉදිරිපත් කිරීම.

**විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ කටයුතුවලට සිදු කළ ගෙවීම්.**

| | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු .මිලියන) | වියදම (රු. මිලියන) | විශ්‍රාම ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|
| ආබාධිත සෙබලුන්ගේ සමාජ ආරක්ෂණ කටයුතු | 16,152.0 | 16,151.6 | 99.99 |
| රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා අනෙකුත් ගෙවීම් | 127,654.1 | 122,813.5 | 96.21 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රසාද දීමනා වෙනුවෙන් | 1000.0 | 480.0 | 48.00 |

# විශ්‍රාමික ප්‍රතිලාභීන් දිස්ත්‍රික් අනුව බෙදී ගොස් ඇති ආකාරය -2013

| | දිස්ත්‍රික්කය | සිවිල් | වැන්දඹු අනත්දරු විශ්රාම වැටුප | හමුදා | පිරිවෙන හා පෞද්ගලික පාසැල් ගුරු | පළාත් පාලන | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 50763 | 24888 | 7085 | 483 | 1834 | 775 | **85828** |
| 2 | ගම්පහ | 44165 | 23028 | 8611 | 400 | 1274 | 1027 | **78505** |
| 3 | කළුතර | 22028 | 8853 | 4302 | 131 | 858 | 752 | **36924** |
| 4 | මහනුවර | 27623 | 10134 | 6404 | 372 | 1122 | 1135 | **46790** |
| 5 | මාතලේ | 6794 | 2765 | 2252 | 22 | 238 | 454 | **12525** |
| 6 | නුවරඑළිය | 4692 | 1997 | 821 | 20 | 123 | 500 | **8153** |
| 7 | ගාල්ල | 18221 | 7020 | 3745 | 81 | 628 | 1023 | **30718** |
| 8 | මාතර | 13640 | 4324 | 2111 | 266 | 387 | 590 | **21318** |
| 9 | හම්බන්තොට | 6406 | 2060 | 1343 | 24 | 210 | 111 | **10154** |
| 10 | යාපනය | 9269 | 4749 | 68 | 76 | 248 | 306 | **14716** |
| 11 | මන්නාරම | 796 | 333 | 0 | 0 | 0 | 0 | **1129** |
| 12 | වවුනියා | 1526 | 847 | 83 | 0 | 39 | 0 | **2495** |
| 13 | මුලතිවු | 418 | 201 | 0 | 0 | 0 | 0 | **619** |
| 14 | කිළිනොච්චි | 536 | 276 | 5 | 0 | 16 | 0 | **833** |
| 15 | මඩකලපුව | 4199 | 2218 | 202 | 5 | 176 | 113 | **6913** |
| 16 | අම්පාර | 4178 | 2113 | 1004 | 3 | 89 | 27 | **7414** |
| 17 | ත්‍රිකුණාමලය | 2973 | 1674 | 540 | 82 | 97 | 106 | **5472** |
| 18 | කුරුණෑගල | 23818 | 10000 | 7899 | 145 | 701 | 2231 | **44794** |
| 19 | පුත්තලම | 6907 | 3509 | 1385 | 37 | 303 | 237 | **12378** |
| 20 | අනුරාධපුර | 9370 | 5045 | 5978 | 22 | 301 | 573 | **21289** |
| 21 | පොලොන්නරුව | 3817 | 1916 | 1276 | 9 | 37 | 190 | **7245** |
| 22 | බදුල්ල | 10088 | 4336 | 3524 | 27 | 315 | 64 | **18354** |
| 23 | මොණරාගල | 3056 | 1457 | 1605 | 106 | 53 | 96 | **6373** |
| 24 | රත්නපුර | 10081 | 3684 | 1584 | 151 | 228 | 271 | **15999** |
| 25 | කෑගල්ල | 14455 | 5821 | 3397 | 67 | 320 | 701 | **24761** |
| **එකතුව** | | **299819** | **133248** | **65224** | **2529** | **9597** | **11282** | **521699** |
| **විදේශ විශ්‍රාම වැටුප්** | | | | | | | | **5291** |
| **මුළු එකතුව** | | | | | | | | **526990** |




## මාධ්‍ය ඒකකය

"එලදායී වූද විනිවිද භාවයෙන් හා වගකීමෙන් යුක්ත වූද මාධ්‍ය භාවිතයක් මඟින් යාවත්කාලීන වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නීති රීති රැගෙන ප්‍රතිලාභියා වෙත සමීපවීම මතු නොව, ඔවුන් වෙත සංවේදී දෘෂ්ඨියක් හෙලන සමාජයක් කරා මඟ විවර කිරීම වෙනුවෙන් උත්සුකවීම විශ්‍රාම දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ඒකකයේ මෙහෙවර වන්නේය"

## සිදුකර ඇති කාර්ය භාරයන්

වසර 2013 ඔක්තෝම්බර් 08 වැනි දින ජාතික විශ්‍රාමික දින වැඩසටහන කේන්ද්‍රකර ගනිමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ඒකකය ස්ථාපනය වූ අතර, එහිදී එම වැඩසටහන සියලු මාධ්‍ය ආයතනයන්හි මාධ්‍ය ආවරණ ලබාගැනීමට මූලික වශයෙන් කටයුතු සිදුකරනු ලැබීය. එතැන් සිට ආයතනය මඟින් සිදුකරනු ලැබූ විවිධ සමාජ සත්කාරයන් හා විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියෙන් ඔබ්බට ගිය වෙනත් ප්‍රතිලාභ ලබාදීම් ආදියේදී ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් අනුමැතියෙන් මාධ්‍ය නිවේදන නිකුත් කරනු ලැබීය. තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කරන විශ්‍රාම වැටුප් සම්බන්ධ චක්‍රලේක හා අණපනත් පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීමට සිදුවිය.

විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විවිධ උගතුන් අතින් ලියවුනු ලිපි පුවත්පත් මඟින් ප්‍රචාරය කිරීම හා පුවත්පත් වලට විශ්‍රාමිකයින් එවන ගැටළුවලට පිළිතුරු ලබාදීම ද සිදුවිය. තවද 2013-12-02 දින ජාතික රූපවාහිනිය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳව විනාඩි 30 ක වාර්තා වැඩසටහනක් විකාශනය කිරීම සිදුවිය.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වෙත පුවත් හා ඡායාරූප ලබාදීම මඟින් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට තොරතුරු සැපයීම ද ඡායාරූප ගැලරිය හා නිර්මාණ කවුළුව යාවත්කාලීන කිරීම හා මාසික පුවත් විවරණය පවත්වාගෙන යාමද මාධ්‍ය අංශය මඟින් සිදුකළ කාර්යයන් වේ.

## ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රණාම 2013

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව යමින් ශ්‍රී ලාංකීය විශ්‍රාමික ප්‍රජාව වෙත ගෞරවනීය ප්‍රණාමය පුදකිරීම පෙරදැරිකරගෙන 2008 වසරේ සිට ඔක්තෝම්බර් 08 වැනි දිනය ජාතික විශ්‍රාමික දිනය ලෙස ප්‍රකාශයට පත්කොට ඇත.

ඒ අනුව යමින් 2013.10.08 දින ජාතික විශ්‍රාමික දිනය නිමිති කරගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සංකල්පයකට අනුව දෙපාර්තමේන්තුවේදී විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට යෙදුනි. විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගිය සමාජ මෙහෙවරක ආරම්භය සනිටුහන් කරමින් විශ්‍රාමිකයන් රාජ්‍ය සේවයෙන් ලැබූ අත්දැකීම් හා අතිවිශාල දැනුම් සම්භාරය නැවතත් රටේ ආර්ථිකයට දායක කර ගැනීම, ඔවුන් සමාජීය වශයෙන් ශක්තිමත් කිරීම ආදිය වූ කාරණා සඳහා මූලාරම්භයක් ලෙස එදින ක්‍රියාත්මක වූ වැඩ සටහන් අතර සමාජ සේවා අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ පැවැත්වෙන අක්ෂි සායනය සහ නොමිලේ ඇස් කණ්නාඩි ලබා දීමේ වැඩ සටහන, “ලංකා හොස්පිටල්ස්” ආයතනය







අනුග්‍රහයෙන් පැවැත්වෙන වෛද්‍ය සායනය, “මිහින් ලංකා” ආයතනයේ අනුග්‍රහයෙන් දඹදිව වන්දනා චාරිකා සඳහා ගුවන් ටිකට්පත් ලබාදීම වෙනුවෙන් හඳුන්වා දෙන ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන ප්‍රමුඛ වේ. එමෙන්ම විශ්‍රාමික සංගම් ලියාපදිංචියට අදාලව කෙටුම්පත් විෂය භාර අමාත්‍යවරයාට භාරදීම, විශ්‍රාමිකයන්ගේ නිර්මාණ එළිදැක්වීමට හා අලෙවිකර ගැනීමට අවස්ථාවක් උදාකරලීම, “කාගිල්ස් ෆුඩ් සිටි” ආයතනය මඟින් විශ්‍රාමිකයින් වෙනුවෙන්ම නිකුත් කරනු ලබන “කාගිල්ස් ගරුසරු වරප්‍රසාද කාඩ්පත” එළිදැක්වීම ආදී වැඩසටහන් ද ක්‍රියාත්මක විය. විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගිය සමාජ මෙහෙවරක ආරම්භයක් වශයෙන් සමස්ත විශ්‍රාමික ප්‍රජාවට මූල්‍යමය ශක්තියක් ලබාදී ආර්ථික තත්වය වඩාත් ශක්තිමත් කරනු වස් මූල්‍ය ආයතන (රාජ්‍ය හා පෞද්ගලික බැංකු) සමග ඒකාබද්ධව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබීය.

මෙහි මූලික අරමුණ වන්නේ විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික තත්වය රටේ ආර්ථිකයට සක්‍රීයව දායක කර ගැනීම තුලින් ඔවුන්ගේ ජීවන තත්වය වඩ වඩාත් ශක්තිමත් කිරීමයි.මෙම ක්‍රියාවලිය ඵලදායී කර ගැනීම සඳහා විශ්‍රාමිකයින් වෙත ණය පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියක් විවිධ මූල්‍ය ආයතන (රාජ්‍ය හා පෞද්ගලික බැංකු) මගින් ආරම්භ කොට ඇත.



# විසර්ජන ගිණුම 2013

**වියදම් ශීර්ෂ අංකය:** 253 **දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධවෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | සටහ් අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | **<u>පුනරාවර්තන</u>** | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 143,746,100,000 | 1,407,872,807 | -17,378,210 | 145,136,594,597 | 139,768,304,968 | 5,368,289,629 | ඩී.ජී.එස්.ඒ - 3 |
| | **උප එකතුව (පුනරාවර්තන)** | **143,746,100,000** | **1,407,872,807** | **-17,378,210** | **145,136,594,597** | **139,768,304,968** | **5,368,289,629** | |
| | **<u>මූලධන</u>** | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 31,900,000 | 0 | 17,378,210 | 49,278,210 | 40,756,307 | 8,521,903 | ඩී.ජී.එස්.ඒ - 4 |
| | **උප එකතුව (මූලධන)** | **31,900,000** | **0** | **17,378,210** | **49,278,210** | **40,756,307** | **8,521,903** | |
| | **මුළු එකතුව** | **143,778,000,000** | **1,407,872,807** | **0** | **145,185,872,807** | **139,809,061,275** | **5,376,811,532** | |

පිටු අංක 2 සිට 31 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වු ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ පිටු අංක 32 සිට 42 දක්වා ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 2014.03

ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 2014.03

ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2014.03

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම – 2013

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) | සටහන් අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 143,746,100,000 | 1,407,872,807 | -17,378,210 | 145,136,594,597 | 139,768,304,968 | 5,368,289,629 | ඩී.ජී.එස්.ඒ - 3 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 31,900,000 | 0 | 17,378,210 | 49,278,210 | 40,756,307 | 8,521,903 | ඩී.ජී.එස්.ඒ - 4 |
| එකතුව | **143,778,000,000** | **1,407,872,807** | **0** | **145,185,872,807** | **139,809,061,275** | **5,376,811,532** | |

ප්‍රධාන ගණකාධිකාරී

දිනය:-

# වයාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන

| වයාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම වයාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01. සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 31,300,000 | 0 | -2,500,000 | 28,800,000 | 28,018,955 | 781,045 |
| අනෙකුත් වියදම් | 51,275,000 | 0 | -5,500,000 | 45,775,000 | 42,613,277 | 3,161,723 |
| **උප එකතුව** | **82,575,000** | **0** | **-8,000,000** | **74,575,000** | **70,632,232** | **3,942,768** |
| **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 201,000,000 | 0 | 25,000,000 | 226,000,000 | 224,861,513 | 1,138,487 |
| අනෙකුත් වියදම් | 143,462,525,000 | 1,407,872,807 | -34,378,210 | 144,836,019,597 | 139,472,811,223 | 5,363,208,374 |
| **උප එකතුව** | **143,663,525,000** | **1,407,872,807** | **-9,378,210** | **145,062,019,597** | **139,697,672,736** | **5,364,346,861** |
| **මුළු එකතුව** | **143,746,100,000** | **1,407,872,807** | **-17,378,210** | **145,136,594,597** | **139,768,304,968** | **5,368,289,629** |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන

| වැය ශීර්ෂ අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵල (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **01. සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා** | | | | | |
| | | | **මූලධන වත්කම් පුනුරු. හා වැඩි දියුණු කිරීම** | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම | 6,500,000 | 8,278,210 | 14,778,210 | 14,776,008 | 2,202 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,500,000 | 0 | 1,500,000 | 909,115 | 590,885 |
| 2003 | | 11 | වාහන | 1,200,000 | 0 | 1,200,000 | 0 | 1,200,000 |
| | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,750,000 | 2,100,000 | 3,850,000 | 3,467,031 | 382,969 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 9,000,000 | 7,000,000 | 16,000,000 | 14,763,431 | 1,236,569 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | | 11 | කාර්ය මණ්ඩල පුහුණුව | 600,000 | 0 | 600,000 | 0 | 600,000 |
| | | | | **20,550,000** | **17,378,210** | **37,928,210** | **33,915,585** | **4,012,625** |
| | | | **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| | | | **මූලධන වත්කම් පුනුරු. හා වැඩි දියුණු කිරීම** | | | | | |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 750,000 | **0** | 750,000 | 41,200 | 708,800 |
| | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 2,500,000 | 0 | 2,500,000 | 2,482,208 | 17,792 |
| 2104 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම | 7,500,000 | **0** | 7,500,000 | 3,808,314 | 3,691,686 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | | 11 | කාර්ය මණ්ඩල පුහුණුව | 600,000 | 0 | 600,000 | 509,000 | 91,000 |
| | | | | **11,350,000** | **0** | **11,350,000** | **6,840,722** | **4,509,278** |
| | | | | **31,900,000** | **17,378,210** | **49,278,210** | **40,756,307** | **8,521,903** |

ප්‍රධාන ගණකාධිකාරී

# වැඩ සටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

**දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**
**වියදම් ශීර්ෂ අංකය :** 253

| සංකේතය | මූල්‍යකරණය | වැඩසටහන 1 * | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය ** 1 රු. | සත්‍ය වියදම 2 රු. | ශුද්ධ ප්‍රතිපාදනය ** 3 රු. | සත්‍ය වියදම 4 රු. | වියදමේ*** ප්‍රතිශතය (4÷3)X100 % |
| 11 | දේශීය අරමුදල් | 120,685,872,807 | 120,662,015,511 | 120,685,872,807 | 120,662,015,511 | 100 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 24,500,000,000 | 19,147,045,764 | 24,500,000,000 | 19,147,045,764 | 78 |
| | **එකතුව** | 145,185,872,807 | 139,809,061,275 | 145,185,872,807 | 139,809,061,275 | 96 |

ප්‍රධාන ගණකාධිකාරි
දිනය:-

# එක් එක් වැඩ සටහනක ව්‍යාපෘති අනුව වියදම් මූලාකරණය

(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල මූලාකරණය)

**දෙපාර්තමේන්තුවේ නම :** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**වියදම් ශීර්ෂ අංකය** : 253

**වැඩ සටහන් අංකය හා නාමය :** 01 මෙහෙයුම් වැඩසටහන

| සංකේතය | මූලාකරණය<br>සංකේත විස්තරය | ව්‍යාපෘති 1<br>ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | ව්‍යාපෘති 1<br>සත්‍ය වියදම<br>රු. | ව්‍යාපෘති 2<br>ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | ව්‍යාපෘති 2<br>සත්‍ය වියදම<br>රු. | වැඩසටහනේ එකතුව<br>ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | වැඩසටහනේ එකතුව<br>සත්‍ය වියදම<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| 11 | දේශීය අරමුදල් | 112,503,210 | 104,547,817 | 120,573,369,597 | 120,557,467,694 | 120,685,872,807 | 120,662,015,511 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 0 | 0 | 24,500,000,000 | 19,147,045,764 | 24,500,000,000 | 19,147,045,764 |
| | **එකතුව** | **112,503,210** | **104,547,817** | **145,073,369,597** | **139,704,513,458** | **145,185,872,807** | **139,809,061,275** |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:-

# අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය – 2013

**වියදම් ශීර්ෂ අංකය:** 253 **දෙපාර්තමේන්තුවේ නම :** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය* | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත අනුව 2013/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2013/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | 2013/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 25301 | 81,268,629.51 | 35,565,722.00 | 24,851,003.91 | 91,983,347.60 | 91,988,143.60 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | | | | | | |
| (i) පොදු තැන්පත් | 6000/0/0/15/133 | 12,708,046.02 | 21,885,626.03 | 18,642,006.90 | 9,464,426.89 | 9,464,426.89 |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |

**මු.රෙ.506(2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය, පුද්ගල ගිණුම්වල අදාල ලැයිස්තු සමග සසඳා, එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කල බවට තහවුරු කරමි.**

ප්‍රධාන ගණකාධිකාරි
මුලකුරු සමඟ නම :
දිනය